# ආගමන සමයේ පළමුවන සතිය
## බ්‍රහස්පතින්දා

**පළමුවන දේව ප්‍රකාශනය** **ඉසයියස් 26 : 1–6**

යෙසයා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*ධර්මිෂ්ඨ වූ ද විශ්වාසවන්ත වූ ද ජාතීන් දේව ජනකායට ඇතුල් වන්නෝය.*

ජුදා දේශයෙහි සෙනඟ මේ ගීය ගයන කාලයක් පැමිණෙන්නේය. අපට බලවත් නුවරක් ඇත. කොටු පවුරු බැඳ අප රැකගන්නේ දෙවිඳාණෝ ම ය. හරි දේ කරන සෙනඟක් වන විශ්වාසවන්ත ජනතාවට දේශයට ඇතුල් වීමට හැකි වන ලෙස වාසල් දොරටු හරිනු මැනව. තිරසර අරමුණු ඇතිව ඔබ කෙරෙහි බැඳී සිටින සියලු දෙනා හට ම සමිඳුනි, ඔබ සදා ශාන්තිය දෙන සේක.

සදහටම සමිඳුන් කෙරේ විශ්වාසය තබන්න. එතුමාණෝ ඔබ සැමදා ආරක්ෂා කරන සේක. එතුමාණෝ උඩගු අය පහත් කළ සේක. ඔවුන් විසූ බලවත් නගර බිඳ හෙළූ සේක. එහි පවුරු පොඩි පට්ටම් කොට දූවිල්ලට ඇද දැමූ සේක. පීඩිත වූවෝ ඒ මත දැන් අවිදිති. ඔවුන්ගේ පාදවලින් ඔව්හු ඒවා පාගා දමති.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 118: 1, 8-9, 19-21, 25-27 |
|---|---|

පිළිතුර: සමිඳාණන්ගේ නාමයෙන් වඩින තැනැත්තා ආසිරි ලබන්නේය.

ගීය: සමිඳුන්ට ස්තුති කරන්න. මන්ද, එතුමාණෝ යහපත් ය.
එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේය.
මිනිසා කෙරෙහි විශ්වාසය තැබීමට වඩා
සමිඳුන් කෙරෙහි විශ්වාසය තැබීම යහපත.
අධිපතීන් කෙරෙහි විශ්වාසය තැබීමට වඩා
සමිඳුන් කෙරෙහි විශ්වාසය තැබීම යහපත.

දමිටුකමේ දොරටු මට හැර දෙන්න.
එවිට, එයින් මම ඇතුල් වී සමිඳුන්ට ස්තුති කරන්නෙමි.
මෙන්න, සමිඳුන්ගේ දොරටුව, දැහැමියෝ එයින් ඇතුල් වන්නෝය.
මම ඔබට ස්තුති කරන්නෙමි.
මන්ද ඔබ මට පිළිතුරු දී මාගේ ගැළැවීම වූ සේක.

සමිඳුනි, දැන් අප ගැළැවුව මැනව.
සමිඳුනි, දැන් අපට ජය අත්කර දුන මැනව.
සමිඳාණන්ගේ නාමයෙන් වඩින තැනැත්තේ ආසිරි ලද්දෙකි.
සමිඳුන්ගේ මාළිගාවේ සිට අපි ඔබට ආසිරි පතමු.
සමිඳාණෝ දෙවිඳාණෝ ය. එතුමාණෝ අපට එළිය දුන් සේක.
අතු ගත් අත් ඇතිව පූජාසනය වටා පෙරහරින් ගමන් කරන්න.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ජෙරුසලමට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි,
හඬ නගා ප්‍රකාශ කරන්න.
බිය නොවී උස් හඬින් "ඔබේ දෙවිඳාණෝ වඩින සේකැ"යි
ජුදාහි නගරවලට ප්‍රකාශ කරන්න.
සමිඳුන් වන දෙවිඳාණෝ බලපරාක්‍රමයෙන් වඩින සේක.
ආලේලූයා!

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නා ස්වර්ග රාජ්‍යයට ඇතුල් වන්නේය.*

“ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට “ස්වාමීනි, ස්වාමීනි” යි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නේය. “එහෙයින් යමෙක් මාගේ වචන අසා, ඒවා පිළිපදී ද, ඔහු පර්වතය මත තමාගේ ගෙය තනා ගත් නැණවතෙකුට සමාන ය. වැසි වැස ජලය ගලා සුළඟ හමා ඒ ගෙට ගැසීය. එය පර්වතය මත පිහිටි බැවින් බිඳ නොවැටිණි. තවද යමෙක් මාගේ මේ වචන අසා ඒවා නොපිළිපදී ද, ඔහු වැලි මත ගෙය තනාගත් අනුවණ මනුෂ්‍යයෙකුට සමාන ය. වැසි වැස, ජලය ගලා, සුළඟ හමා ඒ ගෙට ගැසීය. එය බිඳ වැටිණි. එහි වැටීම ද භයංකර විය.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*